කවරෙකු මම ඉස්ලාමයෙන් ඉවත් වන්නෙක්මි යැයි පවසා (යමක් සම්බන්ධයෙන්) දිවුරා සිටියේ ද, ඔහු බොරු කාරයෙක් නම් ඔහු කියූ පරිදිම එය වනු ඇත. ඔහු සත්යවාදියෙකු නම් ඔහු ඉස්ලාමය වෙත සුරක්ෂිතව නැවත යොමු වන්නේ නැත.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව බුරෙයිදා - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “කවරෙකු මම ඉස්ලාමයෙන් ඉවත්
වන්නෙක්මි යැයි පවසා (යමක් සම්බන්ධයෙන්) දිවුරා සිටියේ ද, ඔහු බොරු කාරයෙක් නම්
ඔහු කියූ පරිදිම එය වනු ඇත. ඔහු සත්යවාදියෙකු නම් ඔහු ඉස්ලාමය වෙත සුරක්ෂිතව නැවත
යොමු වන්නේ නැත.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

හදීසයේ තේරුම: තමන් ඉස්ලාමයෙන් ඉවත් වන බවට පවසා යමෙකු දිවුරා සිටින්නේ නම් හෝ තමන් යුදෙව්වෙකු හෝ කිතුනුවෙකු හෝ දේව ප්රතික්ෂේපකයකු හෝ අදේව වාදියෙකු වන්නේ යැයි පවසා සිටින්නේ නම් හෝ ඔහුගේ කරුණ තත්ත්වයන් දෙකක් මත පවතී. පළමු තත්ත්වය: ඔහු කවර දෙයක් මත දිවුරා සිටියේ ද ඒ සම්බන්ධයෙන් ඔහු බොරුකාරයකු වීමය. උදාහරණ වශයෙන්, මෙම කරුණ මෙසේ මෙසේ වී නම්, මම ඉස්ලාමයෙන් බැහැර වෙමි යැයි පවසා ඔහු කවර දෙයක් සම්බන්ධයෙන් දන්වා සිටියේ ද එය බොරුවක් නම්, -එනම්: සැබැවින්ම සෙයිද් අද දින ගමන නිමා කොට එනු ඇතැයි දන්වා එසේ වී නම් තමන් ඉස්ලාමයෙන් ඉවත් වන බවට හෝ යුදෙව්වෙකු, කිතුනුවෙක් දේව ආදේශයකු බවට පත් වන්නේය යැයි හෝ තමන් පවසන දෑ බොරුවක් බව දැන දැනත් දිවුරා සිටින්නාක් මෙනි.- එවිට ඔහු පවසන අයුරින්ම ඉස්ලාමයෙන් ඉවත් වන්නෙකු බවට හෝ යුදෙව්වෙකු කිතුනුවෙකු දේව ආදේශයකු බවට හෝ පත් වන්නේය. දෙවන තත්ත්වය: ඔහු පවසා සිටි දෑහි සත්යවාදියකු වීමය. එය සැබැවින්ම සෙයිද් අද දින ගමන නිමා කොට එනු ඇත. සැබැවින්ම ඔහු මෙම කරුණ සිදු කොට නොමැත යැයි දන්වා තමන් ඉස්ලාමයෙන් ඉවත් වන බවට හෝ යුදෙව්වෙකු කිතුනුවෙක් දේව ආදේශයකු බවට පත් වන්නේය යැයි දිවුරා සිටින්නාක් මෙනි. ඔහු දිවුරා සිටි දෑහි ඔහු සත්යවාදියෙකු නම් සැබැවින්ම ඔහු මෙම තත්ත්වය මත අල්ලාහ්ගේ දූතයාණන් පැවසූ පරිදි යහපත් තත්ත්වයකින් ඉස්ලාමය වෙත නැවත හැරෙන්නේ නැත. ඔහු විසින් කළ මෙම අප්රසන්න ප්රකාශය හේතුවෙන් ඔහුගේ ඉස්ලාමයේ පූර්ණභාවය අඩු වී යනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/8965